# නිතර සටන් වදිමින් රැකෙන අපේ රාජ්‍ය සෞඛ්‍ය සේවය

ලංකාවේ තවමත් කොයි තරම් වටින රාජ්‍ය සෞඛ්‍ය සේවාවක් තියෙනවද කියලා මට වැටහුනේ කොළඹ මහ ඉස්පිරිතාලෙන් මගේ මූත්‍රා පද්ධතියේ ඇති වුණ ගල් ඉවත් කිරීම සඳහා සේවය ගන්න පටන් ගත්තහමයි.

විශේෂඥදොස්තර ගුණවර්ධන මහත්තයගේ 22 වැනි වාට්ටුවට ඇතුල් වෙනකල් මං හිතා හිටියේ හුහක් තදබද තියෙන පහසුකම් අඩු තැනකටයි මං යන්නේ කියලා.

ඇත්තටම 22 වැනි වාට්ටුව සුපිරි වාට්ටුවක්. ලෙඩ්ඩු රස්තියාදු වෙන වාට්ටුවක් නම් නෙවෙයි. මට හිතෙන්නේ අනෙක් වාට්ටුත් ඒ වගේ ඉහළ තත්වයක තියෙනව ඇති කියලා. විශේෂයෙන් වැසිකිළි කොහොම වෙයිද කියලා මං කල්පනා කර කර හිටියේ. ඉතා ඉහළ මට්ටමක තියෙන වැසිකිළි දැක්කහම මට ලෙඩේ බාගයක් ඉවර වුණා කියලා හිතුනා.

එතැන හිටිය අනෙක් දොස්තරවරු හා සේවකයින් මං ගැන දන හිටියත් මට විශේෂයෙන් උදව්වක් කළේ නෑ. එහෙම අවශ්‍ය වුණෙත් නෑ. මොකද? හැම ලෙඩෙක්ටම හොඳට සලකල ගෙවන ලෙඩ ජීවිතය සතුටු කරන්න හැම කෙනාම කටයුතු කළ නිසා. එතැන ප්‍රධාන හෙදියත් ලොකු ආඩම්බරයකින් කිව්වා ඇය අවුරුදු 17 ක්ම දන් සේවය කරල තියෙනව කියලා. මොකද? ගුණවර්ධන දොස්තර මහත්තය තදින්ම ලොකු සේවයක් හැම කෙනෙක්ගෙන්ම බලාපොරොත්තු වුණා.

ඒ වගේම තමන්ගේ රාජකාරියත් ඉහළින්ම කළා. හැම ලෙඩෙක් ගැනම සොයා බලලා ඉක්මන් සුවයක් ලබාදීලා වාට්ටුවෙන් එළියට යවන්න තමා උන්නැහේ හැම විටම කල්පනා කළේ. ඒ නිසාම එතුමා යටතේ සිටි සෑම සේවකයෙක්ම තම රාජකාරිය හොඳින් කළා.

මගේ ගම් පලාතෙන් ඇවිත් හිටිය බණ්ඩාර ඇටෙන්ඩන්ට් මහත්තයත් අලුත් තරුණයෙක් වුණත් තමන්ගේ රාජකාරිය ඉතාම ඉහළ ශිල්ප දැනුමෙන් ක්‍රියාත්මක කළ බවයි මට තේරුණේ.

ලෙඩේ හරියට හඳුනා ගැනීම සඳහා මට සිද්ධ වුණා X කිරණ කාමරවලට කිහිප වතාවක් යන්නට. ප්‍රධාන කිරණ අංශයෙන් ලෙඩේ හරියට හඳුනාගන්නට විවිධ විදියට ශරීරයේ පහළ කොටසේ X කිරණ පටිගත කළා.

මුලු ඇඟම එහා මෙහා යන චලන දර්ශනත් ගත්තා. මේ වැඩේට ලොකු වේලාවකුත්, මට ලොකු කරදරයකුත් වුණාට වැඩේ අකුරටම කරන්න කොච්චර ඒ ඇත්තෝ මහන්සි වුණාද? මට විතරක් නෙවෙයි, අනෙකුත් ලෙඩුන්ටත් ඒ වගේම ලොකු වෙහෙසක් දරලා වැඩ කළා.

දොස්තර නෝනලා, X කිරණ පරීක්ෂකවරු එහෙට යනවා, මෙහෙට යනවා, කෙළවරක් නැතුව. එවේලෙම සියළු තොරතුරු ලියලා දෙන්නට තමා ඒ අය වැඩ කළේ. එතැනදී ලබාගත් ඒ තොරතුරු ටික පුද්ගලික අංශයෙන් කරවා ගන්න ගියා නම් මට ලක්ෂ කිහිපයක්වත් ගෙවන්න වෙයි කියලයි හිතෙන්නේ.

දුප්පත් රටක් වෙලත් මේ වගේ විශාල රාජ්‍ය සෞඛ්‍ය සේවයක් තිබෙන්න අපි කොයි තරම් වාසනාවන්තද කියලා මට හිතුනා. හුඟ දෙනෙක්, දොස්තරවරු, සෞඛ්‍ය සේවකයෝ වැඩවර්ජනය කරන කොට නැත්නම් උද්ඝෝෂණ කරන කොට එදා නැති වුණ සේවය ගැන හිතලා දෙස් දෙවොල් තියනව.

ඒත් මේ අය අමතක කරනව, දොස්තරලා, නර්ස්ලා, අනෙක් සේවකයෝ සේවය උසස් මට්ටමක තබා ගැනීම වෙනුවෙන් තමයි සටන් කරන්නේ කියලා. පාලනයේ වැරදි, අසමානකම්, අතිකාල දීමනා, පඩිනඩි ගැටළු මේවා විසඳා ගන්නේ නැතිව මේ ඉස්තරම් සේවය කොහොමටත් ගෙනියන්න බෑ.

හැමදාම සෞඛ්‍ය සේවයේ සටන්වලට අත දීපු මට ආඩම්බර හිතුනා මේවගේ දෙයක් පවත්වාගෙන යන්න නේද මාත් උදව් වුනේ කියලා.

22 වාට්ටුවෙන් එළියට එනකොටම සැලැස්ම අනුව 45 ක්ලිනික් කාමරයට ගිහින් ඊළඟ සායනය ගැන දින දමාගන්න වෙනව. ක්ලිනික් පටන් ගන්නේ දවල් එකට වුණාට 11.45 ඉඳන් නොම්මර අරන් ලෑස්ති වෙන්න වෙනව.

1.00 වෙනකොට ගුණවර්ධන මහ දොස්තර මහත්තයත් එයාගේ ගෝලයොත් ඇවිත් නිහඬව ලෙඩ්ඩු බලාගෙන බලාගෙන යනව. හරියට කාඩ්පත් චෙක් කරල පිළිවෙලට ඇතුල් කරල පෝලිම මෙහෙයුම කරන්නේ ජෙරාඩ් ඇටෙන්ඩන්ට් මහත්තයයි. මිනිහ බැලූ බැල්මට කිඳුරංගනා ටෙලි නාට්‍යයේ ප්‍රදීප්ගේ චරිතය වගේ, සිරා පොරක්. හැබැයි මෙහෙයුම හරියට කරගෙන යනව.

පෝලිමේ අංක ලබාගෙන යන වැඩපිළිවෙල බැලුවහම මට මතක් වුණේ ට්‍රොට්ස්කි එදා රුසියාවේ පෝලිම් ගැන කියාපු කථාව. භාණ්ඩ හෝ සේවා සඳහා ඉල්ලුම වැඩි වේ නම් පෝලිම් හදන්නම වෙනවා.

ඒත් ඕනෑම පෝලිමක බෙදන හැන්ද තියෙන්නේ මිනිහෙක්ගේ අතේ. තදබද වෙලාවක අම්මා පෝලිමේ හිටියත් අහක බලාගෙන බෙදන එක අමාරු වැඩක්. මේ නිසා පෝලිම පන්නලා තම දන්න කියන අයට උදව්පදව් කිරීමෙන් තමා නිළධාරිවාදය ආරම්භ වෙන්නේ. ඒක නවත්වන්න අමාරුයි. ඒත් එය සීමා කිරීම අවශ්‍යමයි.

රෝහලේ පෝලිම්වලත් වරප්‍රසාද ලයින් එකක් වැඩ කරනව. ඒක හඳුන්වන්නේ Staff කියලා.
මේක මට වැටහුනේ 22 වාට්ටුවට ඇතුල්වීමට පාන්දර 7.00 ට ඉස්සෙල්ලාම ගිය වෙලාවේ.

මං හත්වැනි තැන වාඩි වෙලා ඉන්නකොට මා ළඟට ආපු ඇටෙන්ඩන්ට් මහත්තයෙක් ඇහැව්වා "ඔයා Staff ද?" කියලා. මට හිතුනේ රෝහලේ සේවකයෙක්ද කියලා ඇහැව්වා කියලා. මං නෑ කිව්වා. ඊට පස්සේ 10 වෙනියට විතර තව නිළධාරී පෙනුම ඇත්තෙක් වාඩි වෙලා හිටියා. එයා කිව්වා "මං ස්ටාෆ්" කියලා. එතකොට පෝලිම භාර ඇටෙන්ඩන්ට් උන්නැහේ කිව්වා "හරි, ඔයාව පළවෙනි පස් දෙනා අතරට දමන්නම්" කියලා.

ඒ නිළිධාරි මහත්තයා මාත් එක්ක කථාවට වැටුනට පස්සේ මං දැනගත්ත එයා පොලිස් මූලස්ථාන පරීක්ෂකවරයෙක්.
එතකොටයි මට තේරුණේ යම් රාජකාරී මට්ටමක් තියෙන ඕනෑ කෙනෙකුට ස්ටාෆ් වරප්‍රසාදය හිමි බව.

45 කාමරයේ පෝලිමේදීත් ජෙරාඩ් මහත්තයා මට ඒ Staff වරප්‍රසාදය දීල මුලින්ම ඇතුලට දැම්මා. කවුරුවත් කැකෝ ගැහැව්වේ නැති නිසා මාත් කරබාගෙන පුටුවේ වාඩි වෙලා හිටියා.

කොහොමටත් මේ සේවාව නම් විශාල භාග්‍යයක්. දොස්තරවරු, නර්ස්ලා, අනෙක් සේවකයෝ නිතර සටන් වදිමින් මේක මේ තත්වයෙන් රැකගෙන ඉදීම ගැන ඔවුන්ට පිං□